# 'අයන් මෑන් 70.3' 24දා කොළඹදී

■ ක්‍රිෂාන් පතිරත් ජයසූරිය.

ජාත්‍යන්තර 'අයන් මෑන් 70.3' (Iron Man 70.3) තරගය එළැඹෙන 24 වැනිදා දෙවැනි වරටත් කොළඹ ගාලු මුවදොර පිටිය කේන්ද්‍ර කරගනිමින් පැවැත්වෙන අතර මෙම තරගාවලිය සඳහා රටවල් 58ක ක්‍රීඩකයන් 739ක් සහභාගි වීමට නියමිතය. පිහිනීම, පාපැදි ධාවනය සහ දිවීම යන තරග ඉසව් ත්‍රිත්වය ඔස්සේ කිලෝමීටර් 113ක (සැතපුම් 70.3ක) දුර ප්‍රමාණයක් මෙම තරගය ඔස්සේ ආවරණය කළ යුතු වීම විශේෂත්වයයි.

ශ්‍රී ලංකා සංචාරක, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික සබඳතා අමාත්‍යාංශයේ හා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ මෙහෙයවීමෙන් 'අයන් මෑන් 70.3' තරගාවලිය කොළඹදී මෙවරත් උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට කටයුතු යොදා ඇතැයි ශ්‍රී ලංකා ක්‍රීඩා අධිකාරිය නිවේදනය කරයි.